ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2008 අංක 6 දරන අපි වෙනුවෙන් අපි අරමුදල පනත

[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2008 පෙබරවාරි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5. රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 11.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

2008 අංක 6 දරන අපි වෙනුවෙන් අපි අරමුදල පනත

[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 19 වන දින]

එල්. ඩී.— ඕ. 28/2007.

සන්නද්ධ සේවාවල සාමාජිකයන්ට නිවාස තැනීම සඳහා හෝ නිවාස මිල දී ගැනීම සඳහා ණය ලබාදීම පිණිස "අපි වෙනුවෙන් අපි අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන අරමුදලක් පිහිටුවීම සඳහා ද, ඒ සම්බන්ධයෙන් හෝ ආනුෂංගික කරුණු සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2008 අංක 6 දරන අපි වෙනුවෙන් අපි අරමුදල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) මෙහි 4 වන වගන්තියේ සඳහන් කර ඇති පරිදි අරමුදලේ පරමාර්ථ සහ අරමුණු බලාත්මක කිරීමේ කාර්ය සඳහා (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "අපි වෙනුවෙන් අපි අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. අපි වෙනුවෙන් අපි අරමුදල පිහිටුවීම.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලබන අරමුදල, "අපි වෙනුවෙන් අපි අරමුදල" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, සංස්ථාවට පොදු මුද්‍රාවක් තබාගෙන එය භාවිත කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරිය ඇතිව සංස්ථාව විසින් එකී නාමයෙන් නඩු පැවරීම සහ එයට විරුද්ධව නඩු පැවරීම ද කළ හැකි වන්නේ ය.

3. (1) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය. අරමුදලේ කළමනාකරණ මණ්ඩලය.

(2) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන් එනම්:—

(i) රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයකු ;

2—PL 002607—3,550 (2007/11)

(ii) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයෙක් ;

(iii) 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරී ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාව විසින් නම් කරනු ලබන වරලත් ගණකාධිකාරී සභාවේ සභාපතිවරයා හෝ සමාජිකයෙක් ;

(iv) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ සභාව මගින් නම් කරනු ලබන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයා හෝ සාමාජිකයෙක් ; සහ

(ආ) නීතිය සහ මූල්‍ය යන ක්ෂේත්‍රවල අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද හෝ විශේෂඥ දැනුම ඇති තැනැත්තන් අතුරින් රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් දෙදෙනෙක්.

(3) රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය.

(4) මණ්ඩලයේ සභාපතිවරයාට පිටපතක් ඇතිව පත්වීම් බලධරයා අමතන ලිපියක් මගින් මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකුට කවර හෝ අවස්ථාවක දී සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) යම් තැනැත්තකු —

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙක් වේ නම් හෝ එවැනි මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත්වුවහොත් ; හෝ

(ආ) මාස හයකට අඩු නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි චරිත දූෂණ වරදකට අදාළ වන වරදකට වරදකරු වුවහොත් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මක වන යම් නීතියක් යටතේ සිහිවිකල් පුද්ගලයකු බවට තීරණය කරනු ලැබුවහොත් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබුවහොත් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්වන නීතියක් යටතේ බූන්වත් භාවයෙන් හෝ බංකොලොත් භාවයෙන් නිදහස් කරනු නොලැබූ පුද්ගලයකු බවට ප්‍රකාශයට පත්කර ඇත්නම්,

එම තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කිරීමට හෝ එම ධූරයේ දිගටම කටයුතු කිරීමට නුසුදුස්සකු වන්නේ ය.

(6) (අ) යම් පත්කළ සාමාජිකයකු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුතු ය.

(ආ) මණ්ඩලයේ පත් කළ යම් සාමාජිකයකු තම ධූර කාලය අවසන්වීමට පෙර මියයෑමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ අන්‍යාකාරයකින් තම ධූරය හිස්කළහොත් ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් තම පූර්වගාමියාගේ ඉතිරි ධූර කාලය සඳහා ධූර දැරිය යුතු ය.

(7) මණ්ඩලයේ ලේකම්වරයා ලෙස මණ්ඩලය විසින් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(8) මණ්ඩලයේ සියලු රැස්වීම්වල දී මණ්ඩලයේ සභාපතිවරයා මූලාසන දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) උපඡේදය යටතේ පත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයා එම රැස්වීමේ මූලාසන දැරිය යුතු ය. සභාපතිවරයා සහ නියෝජ්‍ය අධිපතිවරයා යන දෙදෙනාම යම් රැස්වීමකට නොපැමිණි අවස්ථාවක, මණ්ඩලයේ සෙසු සාමාජිකයන් විසින් එම රැස්වීමට පැමිණ සිටින මණ්ඩලයේ යම් සාමාජිකයකු එම රැස්වීම සඳහා සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගත යුතු ය.

(9) (අ) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් වෙනස් මත ඇතිවූවහොත්, එවිට පැමිණ සිටින සාමාජිකයන් බහුතරයක් විසින් ගනු ලබන තීරණයෙන් මණ්ඩලය බැඳී සිටින අතර, එය බලාත්මක විය යුතු ය.

(ආ) මණ්ඩලයේ සාමාජිකයන්ගේ ඡන්ද සමාන වුවහොත් සභාපතිවරයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(10) සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් වලංගු නොවන ලෙස සලකනු නොලැබිය යුතු ය.

(11) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් හතර දෙනකු විය යුතු ය.

(12) (11) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් ස්වකීය රැස්වීම් සම්බන්ධයෙන් සහ එකී රැස්වීම්වල ගණුදෙනුවල කාර්ය සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය ක්‍රමවත් කිරීම සඳහා රීති සාදනු ලැබිය හැකි ය.

අරමුදලේ අරමුණු සහ පරමාර්ථ.

4. අරමුදලේ අරමුණු සහ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු ය:—

(අ) සන්නද්ධ සේවාවල සාමාජිකයන්ට නිවාස ඉදිකිරීම පිණිස මූල්‍යමය සහාය ලබාදීම සඳහා යෝජනා ක්‍රම ඇති කිරීම ;

(ආ) මේ පනත යටතේ සුදුසුකම් ලබන සන්නද්ධ හමුදා සාමාජිකයන්ට නිවාස පහසුකම් ලබා ගැනීම සඳහා ආධාර ලබාදීම ;

(ඇ) සන්නද්ධ සේවා සාමාජිකයන් විසින් මූල්‍ය ආයතන වලින් ණය ලබා ගැනීම සඳහා සහ එම ණය ගෙවීම සඳහා එම සන්නද්ධ සේවා සාමාජිකයන්ට ආධාර ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඈ) සන්නද්ධ හමුදා සාමාජිකයකු මිය යන අවස්ථාවේ දී හෝ සටනේ දී හෝ අන්‍යාකාරයකට ස්ථිරව ආබාධිතයකු වන අවස්ථාවක දී හෝ තුවාල සිදුවන අවස්ථාවක දී ණය ආපසු ගෙවනු ලැබීම සහතික කර ගැනීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කිරීම ;

මණ්ඩලයේ බලතල.

5. (1) අරමුදලේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අරමුදලේ නාමයෙන් අවශ්‍ය වන හෝ අදාළ වන හෝ ආනුෂංගික වන සියලු ක්‍රියා කිරීමේ බලය මණ්ඩලයට ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගති විරහිතව, මණ්ඩලයට පහත දැක්වෙන බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය යුත්තේ ය :—

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ අන්‍යාකාරයකින් අරමුදල් රැස්කිරීම, ප්‍රදාන, ත්‍යාග සහ පරිත්‍යාග භාර ගැනීම ;

(ආ) මේ පනත මගින් හෝ යම් මිල දී ගැනීමක්, ත්‍යාගයක්, ප්‍රදානයක් හෝ තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාරව හෝ අන්‍යාකාරයකින් මණ්ඩලය සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් මිල දී ගැනීම, අත්කර ගැනීම හෝ දැරීම එම අරමුදලට අයත් වන යම් දේපළක් විකිණීම, උකස් කිරීම, බද්දට දීම, ප්‍රදානය කිරීම, පැවරීම, සතු කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඇ) අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් රැස්කර ගැනීම පිණිස (45 වන අධිකාරය) ලොතරැයි ආඥාපනතේ විධිවිධානයන්ට යටත්ව යම් ලොතරැයියක් පැවැත්වීම ;

(ඈ) මේ පනතේ විධිවිධානවලට යටත්ව නිලධරයන්, සේවා නියුක්තයන් සහ සේවකයන් පත් කිරීම සහ ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ එම නිලධරයන්ගේ, සේවා නියුක්තයන්ගේ සහ සේවකයන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, පාරිශ්‍රමික ලබාදීම් සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් රීති සෑදීම සහ ඔවුන්ට නිවාඩු සහ වෙනත් ප්‍රතිලාභ ලබා දීම ;

(ඉ) බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා ද, අරමුදලේ අරමුණු ඉටුකිරීම සඳහා ද, අවශ්‍ය වන සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම්වලට සෘජුව හෝ මණ්ඩලය වෙනුවෙන් බලය පවරන ලද නිලධරයන්, සේවා නියුක්තයන්, සේවකයන් සහ අනුයෝජිතයන් මගින් ඇතුළත් වී ඒවා ඉටු කිරීම ;

(ඊ) මුදල් ආයෝජනය කිරීම සඳහා නීතිය මගින් බලය පවරා ඇති යම් ආයෝජනවල මණ්ඩලයේ අභිමතය පරිදි අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම සහ මණ්ඩලයේ අභිමතය

පරිදි එම ආයෝජන ආපසු කැඳවීම, ආයෝජනය කිරීම සහ වෙනස් කිරීම සහ එම ආයෝජනවලින් හටගත්තා වූ හෝ උපචිත වන ආදායම එකතු කර ගැනීම ;

(උ) අරමුදලේ කාර්ය සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම හා වැසීම සහ අරමුදලේ දේපළ ඇපයක් වශයෙන් තබා හෝ එවැනි ඇප නොමැතිව මුදල් ණයට ගැනීම හෝ රැස් කිරීම ; සහ

(ඌ) අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ආනුෂංගික වන හෝ උපකාරි වන සියලු ක්‍රියා හෝ දේ ඉටු කිරීම.

අරමුදලේ පරිපාලනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රධාන ගිණුම් නිලධරයා වගකිව යුතු බව.

6. මණ්ඩලය මගින් පත් කරන ලද අරමුදලේ ප්‍රධාන ගිණුම් නිලධරයකු විය යුතු අතර, විශේෂයෙන් 7 වන සහ 8 වන වගන්තිවල කරුණු සහ 2 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති අරමුදලේ කළමනාකරණය හා පරිපාලනය පිළිබඳව මණ්ඩලයේ අනුමතිය ඇතිව වගකිව යුතු වන්නේ ය.

අරමුදලට මුදල් ගෙවීම.

7. පහත දැක්වෙන මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය :–

(අ) දේශීය හෝ විදේශීය වශයෙන් ලැබෙන යම් ප්‍රදාන, ත්‍යාග, පරිත්‍යාග හෝ රැස්කර ගත් හෝ භාරගත් යම් මුදල් ;

(ආ) මේ පනත ආරම්භවීමට පෙර දේශීය වශයෙන් හෝ විදේශවලින් අරමුදලට ලැබුණු හෝ එකතු කර ගත් යම් මුදල්, ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ;

(ඇ) අරමුදලේ අරමුණු සහ පරමාර්ථ ඉටුකර ගැනීමේ කාර්ය සඳහා කලින් කල ආණ්ඩුවෙන් ලැබුණු ප්‍රදාන ;

(ඈ) 1978 අංක 7 දරන ජනාධිපති අරමුදලේ පනතින් පිහිටුවනු ලැබූ ජනාධිපති අරමුදලින් කලින් කල ලබාදෙනු ලැබිය හැකි මුදල් ;

(ඉ) 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික ආරක්ෂක අරමුදලින් ලැබෙන යම් මුදලක් ;

(ඊ) අරමුදලට ලැබිය යුතු ආයෝජනවලින් හෝ වෙනත් ලැබීම් වලින් ලැබෙන මුදල්.

අරමුදලින් ගෙවනු ලබන මුදල්.

8. පහත දැක්වෙන මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය:—

(අ) අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සියලු වියදම් ;

(ආ) සන්නද්ධ හමුදා සාමාජිකයන්ට ප්‍රදානය කරන ලද ණය මත උපචිත වූ පොලිය ;

(ඇ) අරමුදලේ අරමුණු ඉටු කර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය බවට මණ්ඩලය විසින් අනුමත කරන ලද සියලු ගෙවීම්.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම පවත්වාගෙන යාම.

9. අරමුදල විසින් පවත්වාගෙන යනු ලබන "අපි වෙනුවෙන් අපි අරමුදල" යන නාමයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදලක් තිබිය යුතු අතර, 7 වන වගන්තිය යටතේ අරමුදලට ගෙවිය යුතු මුදල් එකී ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

අරමුදල බදුවලින් නිදහස් කිරීම.

10. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අරමුදල 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව අවසර දෙනු ලබන ප්‍රමාණයට අරමුදලේ ආදායම හෝ ලාභ මත ගෙවිය යුතු ආදායම් බද්ධ ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

11. (1) අරමුදලේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් හා වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි පරිදි ගිණුම් පොත් තැබීමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සෑම වර්ෂයකම දෙසැම්බර් මස තිස් එක් වන දිනයේ දී මණ්ඩලයේ පොත්පත් තුලනය කිරීම සඳහා මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු අතර, එළඹෙන වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දින හෝ එදිනට පෙර මණ්ඩලයේ අනුමතිය සඳහා මණ්ඩලය විසින් පහත දැක්වෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කොට මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:—

(අ) එම වර්ෂය සඳහා අරමුදලේ සියලු ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර ඇතුළත් ආදායම සහ වියදම පිළිබඳ ගිණුම ;

(ආ) දෙසැම්බර් මස තිස් එක් වන දින වන විට අරමුදල විසින් දරා සිටිනු ලබන සියලු වත්කම් සහ බැරකම්වල සාරාංශයක් ඇතුළත් ශේෂ පත්‍රය ;

(ඈ) අරමුදලට එම වර්ෂයේ දී ගෙවනු ලබන සියලු මුදල් සහ අරමුදලින් ගෙවනු ලබන සියලු මුදල් නිරූපණය කරන මුදල් සංසරණය පිළිබඳ ප්‍රකාශයක්.

(3) (2) වන උපවගන්තියට අනුකූලව පිළියෙල කරන ලද ආදායම් සහ වියදම පිළිබඳ ගිණුම, ශේෂපත්‍රය සහ මුදල් සංසරණය පිළිබඳ ප්‍රකාශය මණ්ඩලයේ අනුමතිය සඳහා අරමුදලේ ප්‍රධාන ගිණුම් නිලධරයාගේ අත්සන යටතේ ඔහු විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) මණ්ඩලය විසින්, මණ්ඩලයේ යෝජනා සම්මතයක් මගින්, (3) වන උපවගන්තිය යටතේ ප්‍රධාන ගිණුම් නිලධරයා විසින් මණ්ඩලය වෙත භාර දෙන ලද ආදායම සහ වියදම් පිළිබඳ ගිණුම්, ශේෂ පත්‍රය සහ මුදල් සංසරණ ප්‍රකාශය අනුමත කරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලය විසින් පනතේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ගන්නා ලද පියවර පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් ඇතුළත් වන අරමුදලේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් ප්‍රධාන ගිණුම් නිලධරයාගේ වාර්තාව පහත දැක්වෙන ලේඛන ද සමග අමාත්‍යවරයා වෙත යැවීමට කටයුතු සැලැස්විය යුතු ය:—

(i) අදාළ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව ; සහ

(ii) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ලේඛන.

(6) අමාත්‍යවරයා විසින්, මේ වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ තමා වෙත ලැබී ඇති වාර්තා සහ ලේඛනවල පිටපත් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

(7) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව සෑම වර්ෂයක දී ම විගණකාධිපතිවරයා විසින් අරමුදලේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතු ය.

අරමුදලේ මුද්‍රාව.

12. (1) අරමුදලේ මුද්‍රාව —

(අ) මණ්ඩලයේ භාරකාරත්වය යටතේ තිබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය ;

(ඇ) මණ්ඩලයේ අනුමතිය ඇතිව සහ තමන් පැමිණ සිටින බවට සාක්ෂියක් වශයෙන් අදාළ ලේඛනයට අත්සන් තබන මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම ලේඛනයකට නොතැබිය යුතු ය. කෙසේ වුව ද මුද්‍රාව තැබීමේ බලය මණ්ඩලයේ යෝජනා සම්මතයක් මගින් අරමුදලේ යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි ය ; සහ

(2) මණ්ඩලයේ මුද්‍රාව තබන ලද සියලු ලේඛනවල ලැයිස්තුවක් තබාගැනීමට මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

13. (1) මේ පනත මගින් නියම කර ඇති යම් කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය. රීති.

(2) මණ්ඩලය විසින් සාදන ලද කිසිම රීතියක්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම් සහ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇත්නම් මිස බලාත්මක නොවිය යුතු ය.

14. (1) නියම කළ යුතු බවට මේ පනත මගින් නියමිත කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය පවරා ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :–

(අ) අරමුදලේ මුදල් බෙදාහරින ආකාරය සහ ක්‍රමය ;

(ආ) ණය මුදල සහ ඊට උපචිත වී ඇති පොලිය ගෙවීම සඳහා වැඩිපුර කාලයක් ප්‍රදානය කිරීමේ දී සලකා බැලිය යුතු අවස්ථානුගත කරුණු හෝ හේතු ;

(ඇ) ණය වාරික ගෙවීමේ ක්‍රමය සහ ආකාරය ;

(ඈ) ණය මුදලක් ලබාගැනීම සඳහා සුදුසුකම් තක්සේරු කිරීමේ දී සැලකිල්ලට ගත යුතු නිර්නායක ;

(ඉ) ලොතරැයි පැවැත්වීමේ ක්‍රමය සහ ආකාරය ;

(ඊ) ණය මුදලක් සඳහා ඉල්ලුම් කිරීමේ ක්‍රමය සහ ආකෘතිය ; සහ

(උ) අරමුදලින් ප්‍රදානය කරන ලද ණය මුදල් ආපසු අයකර ගැනීමේ ක්‍රමය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දින සිට හෝ එම නියෝගයේ සඳහන් පසු දිනයක සිට එම නියෝගය බලාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලබන සෑම නියෝගයක් ම එම අනනුමත දිනයේ සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් අනුමත කරනු නොලැබූ දිනය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ණය මුදලක් සඳහා ඉල්ලුම් කිරීම.

15. මේ පනත යටතේ නිවාස ණයක් සඳහා සුදුසුකම් ලබන යම් සන්නද්ධ හමුදා සාමාජිකයකු විසින් නියමිත ආකෘති පත්‍රයෙහි වූ ඉල්ලීමක් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

එම ඉල්ලුම් පත්‍රය පිරීක්සුම් කිරීමේ ක්‍රමය.

16. එවැනි ඉල්ලීමක් ලැබීමේ දී මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා බලය පවරා ඇති නිලධරයකු විසින් එම ඉල්ලීම පිරික්සුම් කොට එම ඉල්ලුම්කරුගේ සුදුසුකම් සම්බන්ධයෙන් මණ්ඩලය වෙත දැනුම් දී, එම තීරණය සඳහා හේතු ද දැක්විය යුතු ය. මණ්ඩලය විසින් ඉල්ලුම්කරු තෝරා ගැනීම සම්බන්ධයෙන් සෑහීමට පත් වන්නේ නම් මණ්ඩලයේ තීරණය ඉල්ලීම ලැබී සති හතරක් ඇතුළත දී එම ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු ය.

අමාත්‍යවරයා වෙත අභියාචනය කිරීම.

17. (1) මණ්ඩලයේ යම් තීරණයකින් අතෘප්තියට පත්වන යම් ඉල්ලුම්කරුවකු එම තීරණය වෙනස් කිරීම සඳහා හෝ සංශෝධනය කිරීම සඳහා අමාත්‍යවරයා වෙත අභියාචනය කළ හැකි ය.

(2) එවැනි අභියාචනයක් ලැබීමේ දී අමාත්‍යවරයා විසින් ඉල්ලුම්කරුට සහ මණ්ඩලයේ නියෝජිතයකුට කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලබාදීමෙන් පසු—

(අ) අභියාචනයට ඉඩ දෙමින් මණ්ඩලයේ තීරණය ප්‍රතිවර්තනය කළ යුතු ය ;

(ආ) වැඩිදුර තොරතුරු සපයන ලෙස ඉල්ලා සිටිය යුතු ය ; නැතහොත් සාක්ෂි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිය යුතු ය ;

(ඇ) මණ්ඩලයේ තීරණය ස්ථිර කළ යුතු ය.

අමාත්‍යවරයාගේ තීරණය ඉල්ලුම්කරුට දැනුම්දිය යුතු බව.

18. අමාත්‍යවරයාගේ තීරණය මණ්ඩලය වෙත සහ ඉල්ලුම්කරු වෙත දැනුම්දිය යුතු අතර, ඔවුන් එම තීරණයට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

යම් තැනැත්තකුට අරමුදලේ සාමාජිකයකුගේ හෝ නිලධරයන් ආදීන්ගේ දේපළවලට එරෙහිව රිට් බලපත්‍රයක් නිකුත් නොකළ යුතු බව.

19. අරමුදලට එරෙහිව පවරන ලද යම් නඩුවක දී, මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ අරමුදලේ යම් නිලධරයකුට, සේවකයකුට හෝ නියෝජිතයකුට එරෙහිව තැනැත්තකුට හෝ දේපළ සම්බන්ධයෙන් වූ රිට් බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

යම් සිවිල් නඩුවක දී දරන ලද වියදම් අයකර ගැනීම.

20. (1) යම් අධිකරණයක් ඉදිරිපිට මණ්ඩලය විසින් හෝ එයට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් අරමුදලේ මුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී මණ්ඩලය විසින් අයකර ගනු ලබන යම් වියදමක් මණ්ඩලයේ ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

(2) යම් නීතියක් යටතේ හෝ මණ්ඩලයේ විධානය මත යම් තැනැත්තකු විසින් සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ යම් නිලධරයකුට, සේවා නියුක්තයකුට, සේවකයකුට හෝ නියෝජිතයකුට එරෙහිව යම් අධිකරණයක දී පවරන ලද යම් රිට් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී දරන ලද යම් වියදමක් අරමුදලින් ඔහුට ප්‍රතිපූරණය කරනු ලැබිය යුතු ය.

අරමුදලේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

21. අරමුදලේ සියලු නිලධරයන් සහ සේවකයන් (19 වන අධිකාරය වන) දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා සහ එහි අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අරමුදල අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

22. අරමුදල (26 වන අධිකාරය වන) අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

23. මෙම පනතේ "සන්නද්ධ හමුදා සාමාජිකයන්" යන්නෙන්, පිළිවෙලින් (357 වන අධිකාරය වන) යුධ හමුදා පනත (358 වන අධිකාරය වන) නාවික හමුදා පනත (359 වන අධිකාරය වන) ගුවන් හමුදා පනත සහ (53 වන අධිකාරය වන) පොලිස් ආඥාපනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා යුධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ සාමාජිකයන් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

24. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා